ලක්ෂ හැත්තෑවක් තියනවා. ඒක තුන්වෙනි ධාරාව නෙවෙයි. ඒක තමයි ලොකු ධාරාව. ඒක ඒ කට්ටියත් තේරුම් ගන්න ඕනේ. ආණ්ඩුවත්, එක්සත් ජාතික පක්ෂය වුණත් ඒක තේරුම් ගන්න ඕනේ. නැත්නම් ඒගොල්ල කියන්නේ මම කියන දේ වැරදියි කියලද? මම කියන දේ වැරදිනම්, ඒගොල්ල අනුමත කරනවනම් මෙතෙක් කල් රටට වෙච්ච දේ හරි කියලා, එහෙමනම් මේ විනාශය දිගටම වෙන්න ඕනේ කියලද ඒ ගොල්ල කියන්නේ. ඒ අය කියනවද මෙතෙක් කල් රටට වුණ දේ හරියි කියලා. තව අවුරුදු පනහක් යනකොට ඩොලර් එක රුපියල් හාරසියට විතර නගින්න ඕනේ කියලද කියන්නේ. ලෝකයේ අනෙක් රටවලට සාපේක්ෂව රුපේ තත්ත්වය මතින්න පුළුවන් ලේසිම ක්‍රමය තමයි ඩොලර් එක. ඒකයි මම මේ ඩොලර් එක ගැන කතා කළේ. තව අවුරුදු පනහක් අපි හිටියොත් මේ රටේ ඩොලර් එක රුපියල් හාරසියක් විතර වෙන්න ඕනේද එහෙම නැත්නම් අඩුතරමින් හැත්තෑගනන්වල තිබුණේ, ඩොලර් එක රුපියල් හතරයි කියන තැනටවත් යන්න උත්සාහ කරනවද? ඩොලර් 48 000ක ඒක පුද්ගල ආදායමක් තියන රටවල් ආසියාවේ තියෙද්දි මෙහෙ ඩොලර් 2000ක ඒක පුද්ගල ආදායමක් තියාගන දැනුත් ආශ්චර්යයක් ගැන දොඩවනවා. ජනතාව හැමදාම මේවා විශ්වාස කරගෙන ඉන්නවාද නැත්නම් කවුරු හරි මේක වෙනස් කරනවාද? නැත්නම් අපිට මේක කරගන්න බෑ. අපි අනාගතයක් නැති ජාතියක් කියලා හැමදාම එහෙම ඉන්නවාද?

ඔබට නිදහස ලැබුණ පසු ඔබ මාධ්‍යවලට කියා තිබුණ ඊට අදාළ කිසිම නෛතික ලියැවිල්ලක් ඔබට නොලැබුණ බවත්, ඒ නිසා නිදහස කවර ආකාරයේ එකක්ද කියා නොදන්නා බවත්. නිදහස ලැබී මාස කීපයක් ගතවී තියන මේ අවස්ථාව වන විට එහි නෛතික පදනම දැනගන්නට ලැබී තියනවාද?

අපි නිදහස ලබාදීමට අදාළ ලියැවිල්ල ඇපිල් උසාවියෙන් ඉල්ලලා තියනවා. නමුත් තවමත් එය අපිට ලැබිලා නෑ. ආරංචි මාර්ගවල හැටියට මාව හිරෙන් එළියට දැමීමා අපරෙන්න බන්ධනාගාරයේ ගතකළ කාලයෙන් මාව නිදහස් කරලා නෑ. රටේ ව්‍යවස්ථාව අනුව මාස හයක් හිරගෙදර ඉඳලා ආව පුද්ගලයකුට ජන්දේ ඉල්ලන බෑ. ජන්දේ දාන්න බෑ. ඔය සීමාවන්ට අනුවෙන්න තමයි මාව එවලා තියෙන්නේ. නමුත් මම හිරේ දානකොටත් ඒක පසුපස ගිටපු අය කිව්වේ මට අවුරුදු තිහක් හිරබත් කන්න සිද්ධ කරනවා. මාව හිරගෙදර මැරෙන්න අරිනවා. ඒ වගේ කතා කිව්වේ. ඒ කතා ජයගෙන අවුරුදු දොළහමාරකින් එළියට ආවා. මාව හිරේ දැමීමේ දේශපාලන වෛරයක් පිරිමහගන්නයි. මාත් එක්ක මුහුණට මුහුණ දේශපාලනය කරන්න තියන බයට මාව හිරේ දැමීමේ. මම දිනපු ජනාධිපතිවරණයේ ජය හොරෙන් කොල්ලකාලා ඒක රැකගන්නයි මාව හිරේ දැමීමේ. ඒත් කොහොම හරි දේශීය, විදේශීය බලවේග ඔක්කොම එකතුකරලා, සටන් කරලා කොහොම හරි මගේ අයිතිවාසිකම් ලබාගත්තා වගේ ඔය සීමාවනුත් ජයගන්න මට පුළුවන් වෙයි.

ජනාධිපතිවරණය පරාජයට පත්වීමෙන් පසු ඔබ දිගින් දිගටම නගන චෝදනාවක් තමයි ඔබගේ ජයග්‍රහණය කොල්ලකෑවයි කියන එක. ඇත්තෙන්ම එහෙම දෙයක් සිද්ධ වුණා නම් ඇයි ඔබට එය අධිකරණය හමුවේ ඔප්පු කරගන්නට බැරුව ගියේ?

මේ ගැන අපි අධිකරණයට ගියාම අපේ පැමිණිල්ල විසි කළේ තාක්ෂණික කරුණු කාරනා හේතුකරගෙනයි. පැමිණිල්ල ඉදිරිපත් කිරීමේදී යම් යම් අවශ්‍යතා සම්පූර්ණ වෙලා නෑ කියන එකයි එය විසි කිරීමට හේතුවුණේ. නමුත් ජන්දය ගනන් කරලා ඉවරවෙන්න ඉස්සෙල්ලා, රෑ දොළහට ඉස්සෙල්ලා ගනන් කරන තැන හිටිය එක්සත් ජාතික පක්ෂයේ, ජේවීපී එකේ නියෝජිතයන්ට ගහලා එළෙවුවනම්, ඒ ජන්ද ප්‍රතිපලය පිළිගන්නේ කොහොමද? තවත් මොනවද මිකට ඕනේ සාක්ෂි.

ඔබව නිදහස් කරගැනීම සඳහා දේශීය සහ විදේශීය විවිධ පාර්ශ්ව, සංවිධාන, ජනතාව විශාල උත්සාහයක් දැරුවා. ඒ කිසිම පාර්ශ්වයකින් කෙරුණු ඉල්ලීම්වලට ජනාධිපතිවරයා යහපත් ප්‍රතිචාරයක් දැක්වූයේ නෑ. ඔබට නිදහස ලැබෙන්නේ ජනාධිපතිවරයා ඊරාන් අලස් මන්ත්‍රීවරයා සමඟ කෙරුණු පෞද්ගලික සාකච්ඡාවක ප්‍රතිපලයක් ලෙසට කියන එකයි අහන්න ලැබුණේ. මේ කියන සාකච්ඡාවලදී ඔබේ නිදහස වෙනුවෙන් දෙපාර්ශ්වය අතර ඇතිකර ගැණුන කොන්දේසි හෝ එකඟතා මොනවද?

කිසිම කොන්දේසියක් හෝ එකඟතාවක් නැහැ. නමුත් ඊරාන් අලස් සාකච්ඡා කරන්න යනවා කියලා කිව්වම මම එයාට කිව්වා සාකච්ඡා කරනවා නම් අපිට කරපු අසාදාරණයට සාදාරණයක් වෙන්න ඕනේ කියලා. මට හුගාක් දේවල් අහිමි කළා. බොරු චෝදනා දාලා තාමත් මගේ අයිතිවාසිකම් අහිමි කරන්න හදනවා. ඒ හැමදේම හිවැරදි කරන්න ඕනේ. එහෙම නැතිනම් සාකච්ඡාවලට යන්න එපා කියලා මම කිව්වා. මුලදි ඒගොල්ල කියලා තිබුණා ඔව් ඔව් අපි ඒ දේවල් හිවැරදි කරනවා. කැඳැල් ඉතිරිවෙන්න ඉඩ තියන්නේ නෑ. කාටවත් පාඩුවක් වෙන්න ඉඩ තියන්නේ නෑ කියලා. ඒගොල්ල ඒ දවස්වල වෛරයෙන් වෛරය නොසන්සිඳේ කියලා ධර්ම පදයේ ගාථා හිටින් ලිය ලියා ටිරාන් අලස්ට එස්එම්එස් කළා. එහෙම කරලා අන්තිමට කපටිකමක් කරලා මාව එළියට දැම්මා. අර අයින් කළ ඒවා එකක්වත් යථා තත්ත්වයට ගෙනාවේ නෑ. තාමත් වෛරයෙන් ඉන්නේ. තාමත් නඩුත් තියනවා. මගේ මූලික අයිතිවාසිකම් අහිමි කරලා තියනවා. මේ එළියට දැම්මේ ජනතාවගෙන් බේරෙන්න පමණයි. මොකද ජනතාව තුළ මේකට ලොකු විරෝධයක් තිබුණා. විදේශ බලපෑම් ආවා. ලෝකයේ පිළිගත් රටවල් කෙලින්ම ප්‍රකාශ කළා මම දේශපාලන සිරකරුවෙක් කියලා. එහෙම වෙනකොට මේක කරපු පුද්ගලයන්ට මේක ලැජ්ජාවක් වුණා. අපි බලපෑම්වලට යටවෙන්නේ නෑ කියලා චන්ඩියෝ වගේ පෙන්නුවාට මේකෙන් ගොඩවෙන්න ඒගොල්ලන්ට අවශ්‍යතාවක් ආවා. ඒකට අවස්ථාවක් වුණා ටිරාන් අලස් ගිහිල්ලා සාකච්ඡා කළ එක. ගොඩඒන්න වැලක් හොය හොයා හිටිය වෙලාවේ ඒගොල්ල ඒකෙන් ප්‍රයෝජන ගත්තා. අනෙක් බලපෑම් නොතිබුණා නම් ටිරාන් අලස් මන්ත්‍රීතුමා සාකච්ඡා කළා කියලා මාව නිදහස් කරන්නේ නෑ. ඒක අනිවාර්යයි.

ඔබට නිදහස ලබාගැනීමට අවශ්‍ය නම් පවුලේ කෙනෙක් සමාව ඉල්ලන්න ඕනේ කියන දෘඪ ස්ථාවරයක තමයි ජනාධිපතිවරයා හිටියේ. ඔබගේ දියණියක් ලිඛිතව සමාව ඉල්ලීමෙන් පසුවයි මේ නිදහස් කිරීම සිදුවුණේ කියලා කියන්නේ ඇත්තද?

ඒක අමූලික බොරුවක්. එහෙම ලිඛිතව සමාව ඉල්ලීමක් කළා නම් ඒක ඔක්කොටම ඉස්සෙල්ලා ඒගොල්ලම පෙන්නයි මෙන්න අහවලා සමාව ඉල්ලුවා අපෙන් කියලා.

ජාත්‍යන්තර මට්ටමින් ජනාධිපතිවරයාට හෝ ආරක්ෂක ලේකම්වරයාට හෝ ඒ දෙදෙනාටම යුද අපරාධ චෝදනා එල්ලවීමේ අවදානමක් සහිත වෙලාවකයි ඔබව නිදහස් කරන්නේ. ඔබේ නිදහස ගැන කතාබහ කෙරෙනකොට එවැනි යුද අපරාධ චෝදනා එල්ලවීමක් සිදුවුණොත් ඔවුන්ට වාසි සහගත සාක්ෂියක් ලබාදීමට ඔබ එකඟ වුණාද?

කවුරුහරි යුද අපරාධ කරලා තියනවා නම් අනිවාර්යෙන්ම තරාතිරම නොබලා ඔවුන් දඬුවම් ලැබිය යුතුයි. ජනාධිපති, ආරක්ෂක ලේකම්, හමුදාපති හෝ වෙන විශ්වකර්මයෙක් කියලා කාටවත් ලෝකයේ වෙනම නීතියක් නෑ. වෘත්තීයමය සෙබළෙක් විදිහට, පෙනරල්වරයෙක් විදිහට ඒක මම අනුගමනය කරන ප්‍රතිපත්තියක්. ඔප්පු කරන්න පුළුවන් නම්, සාදාරණ හේතු තියනවා නම්. යුද්ධය මෙහෙයවුවේ මම නිසා මම දන්නවා යුද අපරාධ සිදුනොවුණ බව. දහස් ගණන් මැරුණයි කියන කටකතා මම පිළිගන්නේ නෑ. එක්සත් ජාතීන්ගේ නීති රීති අනුව තමයි මම යුද්ධය මෙහෙයවුවේ.

ඔබ දේශපාලනයට ප්‍රවේශවීමත් සමඟ රජගෙන් ඔබට ලබාදුන්න ආරක්ෂාව ඉවත් කෙරෙනවා. නිදහසවීමෙන් පසු නැවත ඔබට රජගෙන් ආරක්ෂාව ලබාදෙනවා. එය ඔබගේ ඉල්ලීමක් අනුව සිදුවූවක්ද?

මුලින්ම මම කිව්වනේ ටිරාන් අලස්ට මම කරුණු කීපයක් කිව්වා කියලා සාකච්ඡා කරන්න. ඒ කරුණුවලින් එකක් තමයි මට මුලින් තිබුණ ආරක්ෂාව නැවත ලබාදිය යුතුයි කියන එක. මට තියන තර්ජණයට මේ දීලා තියන ආරක්ෂාවෙන් වැඩක් නෑ. ජනාධිපතිට, ආරක්ෂක ලේකම්ට තියන තර්ජණයම තමයි මටත් තියෙන්නේ. ඒගොල්ලොත් පිළිගන්නවා මට තර්ජණයක් තියනවා කියලා. මම නවලෝක රෝහලේ ඉන්නකොට නීතිපතිම ගිහිල්ලා උසාවියට කිව්වා මට තියන තර්ජණය නිසා රෝහලේදී අවශ්‍ය ආරක්ෂාව දෙන්න අමාරුයි කියලා. එතන බන්ධනාගාර නිලධාරීන් 30ක් හිටියා. ඒ ප්‍රමාණය මදියි කියලයි ඒගොල්ලම කිව්වේ. ජනාධිපතිගේ ආරක්ෂාවට තුන්දාහක බලකායක් තියාගන්න පුළුවන්නම්, ලේකම්ට පන්සීයක ආරක්ෂාවක් තියාගන්න පුළුවන්නම්, මටත් ඉස්සෙල්ලා පන්සීයක් තිබුණා නම් යුද්ධය අවසන් කළ හමුදාපති හැටියට මට දැන් පොලිසියේ පහළොස්දෙනෙකුගෙන් ඒ ආරක්ෂාව සපයාගන්න පුළුවන්ද? අපි ඉල්ලුවේ තිබුණ ආරක්ෂාව දෙන්න කියලා. නමුත් දිලා තියෙන්නේ ඔච්චරයි. මට මොනව හරි වුණොත් එහි වගකීම අනිවාර්යෙන්ම රජය, ආරක්ෂක ඇමැති, ආරක්ෂක ලේකම් බාරගන්න ඕනේ.

ඔබ දැන් විපක්ෂ දේශපාලනයේ ප්‍රධාන චරිතයක්. මේ විදිහට රජයේ ආරක්ෂාව යටතට පත්වුණාම විපක්ෂ දේශපාලකයෙකු විදිහට ඔබගේ සියළුම කටයුතු ආණ්ඩුවේ සෘජු නිරීක්ෂණයට ලක්වෙනවා නේද?. එය දේශපාලන වශයෙන් අවාසියක් නොවෙයිද?

නෑ ඉතිං. අපි කරන කටයුතු හංගගෙන කරන්නන් බෑ. ඒකේ අමුතුවෙන් නිරීක්ෂණය කරන්න දෙයකුත් නෑ. ඒවගේම මම දන්නවා මම යන හැමතැනම අඩුමතරමින් එන්.අයි.බී. එකෙන් සීයක් විතර ඔත්තු බැලීමේ රාජකාරියට දාලා තියනවා. අපේ ගෙදර ළඟ, ගෙදරට හැරෙන හන්දියේ හැමතැනම සී.අයි.ඩී. කට්ටිය කැරකෙනවා. ඒක කිසිම ලැජ්ජාවක් නැතිව ආණ්ඩුව කරනවා. ඒ නිසා රජයෙන් ආරක්ෂාව ගත්තය කියලා අමුතු දෙයක් වෙන්නේ නෑ.

ඔබගේ දේශපාලන ප්‍රවේශය ගැන දැන් මොකද හිතෙන්නේ? හිවැරදි වෙලාවේ හිවැරදි තීන්දුවක් ගත්තා කියලාද, යම් වැරදීමක් සිදුවුණා කියලද හිතෙන්නේ?

මම හිතන්නේ අනිවාර්යෙන්ම මම හරි වෙලාවට හරි තැනදී දේශපාලනයට ප්‍රවේශ වුණා කියලයි. යුද්දෙ කරනකොට මට එක රාජකාරියක් තිබුණා. මම ඒ රාජකාරිය ඉවර කළා. ඒ කාලේ දේශපාලනඥයෝ කරන දේවල් ගැන හොයන්න මට වෙලාවක් තිබුණේ නෑ. යුද්දෙන් පස්සේ මේගොල්ල රටට සාදාරණයක් ඉටු කරයි, ජනතාවාදී දේශපාලනයක් කරයි කියලා අපි බලාපොරොත්තු වුණා. ඒක කෙරෙන්නේ නෑ කියලා මට තේරුණ ගමන්ම මට තේරුණා මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න ඕනේ කියලා. එහෙම නැත්නම් මේ දේශපාලනඥයෝ රට කාලා ඉවර කරනවා කියලා. ඒ නිසා ප්‍රමාදයෙන් තොරවම මම දේශපාලන ගමනක් ආරම්භ කළා. මම පැන්ෂන් යනකම් ඉඳළා තව අවුරුදු දෙකක් ඒගොල්ලොත් එක්ක සැප විඳලා දේශපාලනයට එන එකද හොඳ? නැත්නම් පුළුවන් තරම් ඉක්මනින් දේශපාලනයට ඇවිල්ලා මේ විපතින් රට ගලවාගන්න එකද හොඳ?

ඔබට අවංකවම කියන්න පුළුවන්ද දේශපාලනයට එන්න ඕනේ කියන අදහස ඔබට මුලින්ම ඇතිවුණේ මොන අවස්ථාවේද කියලා?

අවංකවම යුද්දෙ ඉවර වුණායින් පස්සෙයි මට හිතුනේ. යුද්දෙ පටන්ගන්නකොට මම හමුදාවේ මේජර් කෙනෙක්. අවුරුදු එකොළහක සේවයක් තිබුණා. මේ යුද්ධය ඉවරවෙනවා දැකීමේ අවශ්‍යතාව මගේ ඇගේ හැමදාම තිබුණා. යුද්ධය බරපතල වෙන්න වෙන්න හුගක් හමුදා නිලධාරීන් අස්වෙලා ගියා. සමහරු එහෙම ගිහිල්ලා අවුරුදු පහළොව විස්ස විදේශ රටවල හිටියා. නමුත් අපි දිගටම හිටියා. ලේ වැගුරුවා. ඩාඩිය වැගුරුවා. ඒ ඔක්කොම කළේ ඉස්සෙල්ලම යුද්ධය ඉවර කර ගැනීමේ අවශ්‍යතාවක් අපට තිබුණ නිසයි. ඊට පස්සේ රටේ ආර්ථිකය ගොඩනැගෙන්න ඕනේ. ඒ වෙනුවෙන් කැපකිරීමක් කරන එක සුදුසුයි කියලා මට හිතුණා.

ඔබගේ දේශපාලන ආගමනය පටු පෞද්ගලික හේතූන් මත සිදුවූවක් මිස ඔය කියන විදිහේ පුළුල් දේශපාලන දෘෂ්ටිකින් සිදුවූවක් නොවන බවයි ඔබගේ විරුද්ධවාදීන් කියන්නේ. යුද ජයග්‍රහණයෙන් පසුව ඔබ හමුදාවේ පිරිස් බලය වැඩි කරන්න ඉල්ලීම් කළා, ෆීල්ඩ් මාර්ෂල් තනතුරක් ඉල්ලා හිටියා, ජනාධිපතිවරයා ඒවා ලබා දුන්නේ නෑ, ඒ නිසයි ඔබ දේශපාලනයට ගියේ කියලා ඔවුන් කියනවා. ඒ කාරණා ගැන ඔබ මොකද කියන්නේ?

හමුදා ශක්තිය වැඩි කරන්න මම ඉල්ලීම් කළා. ඇත්ත. හමුදා ක්‍රියාදාමයන් ගැන මෙළොව දෙයක් මේ රටේ දේශපාලනඥයන්ට තේරෙන්නේ නෑ. සමහර වෙලාවට බහුතර ජනතාව විශ්වාස කරන්නෙත් මේ දේශපාලනඥයෝ කියන දේවල් තමයි. අපි 1996 යාපනය අල්ලනකොට ඒ සඳහා පාවිච්චි කළේ සෙබළු 15 000යි. නමුත් එදා ඉඳළා 2010 වෙනකම් යාපනය අල්ලගෙන ඉන්න අපි සෙබළු 35 000ක් යෙදෙව්වා. යුද්ධය දිනුවට පස්සේ හමුදාවට ආරක්ෂා කරන්න තිබුණ ප්‍රදේශය හතර ගුණයකින් වැඩිවුණා. යුද්ධය පටන්ගන්නකොට හමුදාවේ හිටියේ 1 16 000 යි.

16 වන පිටට

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia